# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2364/38 – 2023 දෙසැම්බර් මස 31 වැනි ඉරිදා – 2023.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**වයඹ පළාත් සභාව**

වයඹ පළාතේ පළාත් සභාවේ 2018 අංක 07 දරන
මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2018.10.02 වැනි දින සම්මත කරන ලදුව, 2023.11.16 වැනි දින වයඹ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළකරමි.

එන්. එම්. ජේ. ප්‍රනාන්දු,
සභා ලේකම්,
වයඹ පළාත් සභාව.

2023 දෙසැම්බර් මස 28 වැනි දින,
කුරුණෑගල, වයඹ පළාත් සභාවේ සභා කාර්යාලය.

දීර්ඝ නාමය

**වයඹ පළාතේ පළාත් සභාවේ 2018 අංක 07 දරන**
**මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය**

වයඹ පළාත ඇතුළත මෝටර් වාහන මගින්, පාරවල් ඔස්සේ මගීන් ප්‍රවාහන සේවා සැලසීම සහ විධිමත් කිරීම සඳහා ද, මාර්ගස්ථ ප්‍රවාහන සේවාවන් සහ වයඹ පළාතට අදාළ වන ප්‍රමාණයට වයඹ පළාත හා සම්බන්ධ වන පළාත් ප්‍රවාහන සේවාවන් සැලසීම සහ විධිමත් කිරීම සඳහා ද, වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවීම සඳහා ද ඒ සම්බන්ධයෙන් හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සහ 1995 අංක 04 දරන වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා ද වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තියේ විධිවිධාන සලසා ඇති ප්‍රමාණයට පමණක් වරින්වර සංශෝධිත 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ (203 වන අධිකාරය) විධිවිධාන සහ වරින්වර සංශෝධිත 1983 අංක 44 දරන පෞද්ගලික බස් රථ සේවා පනතේ විධිවිධාන අනනුකූල වේ.

ප්‍රඥප්තිනාමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ක්‍රියාත්මක වන දිනය

01. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2018 අංක 07 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රඥප්තියේ අරමුණු

02. වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දින සිට මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන්නේ ය.

03. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

(1) 1995 අංක 04 දරන වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම.

(2) වයඹ පළාත ඇතුළත මෝටර් වාහන මගින් මාර්ග ඔස්සේ මගීන්, පාසල් ළමුන්, කාර්යාල සේවක/ සේවිකාවන්, කර්මාන්තශාලා සේවක/ සේවිකාවන් ප්‍රවාහනය කාර්යක්ෂමව හා ප්‍රශස්ත මට්ටමින් සැලසීම හා පවත්වාගෙන යාමේ සේවාවන් විධිමත් කිරීම හා එම ප්‍රවාහන කටයුතු පවත්වා ගෙන යාම.

(3) වයඹ පළාතට අදාළ වන ප්‍රමාණයට වයඹ පළාත හා සම්බන්ධ වන පළාත් ප්‍රවාහන සේවාවන් සැලසීම හා විධිමත්ව පවත්වාගෙන යාම.

(4) වයඹ පළාත තුළ මගී ප්‍රවාහන සේවාවේ වර්ධනය හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම වෙනුවෙන් මගී ජනතාවගේත් ආයෝජකයින්ගේත් සංවර්ධනය උදෙසා නව ව්‍යාපෘති හඳුන්වා දීම.

(5) වයඹ පළාතේ පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියක් පිහිටුවීම.

## 1 වන කොටස

### වයඹ පළාතේ පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවීම

මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවීම.

04. (1) මෙහි මින්මතු ''අධිකාරිය'' යනුවෙන් හඳුන්වනු ලබන ''වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය'' පිහිටුවනු ලැබේ.

(2) ඉහත 4(1) වන උපවගන්තිය මගින් අධිකාරියට ලබා දී ඇති නාමයෙන් එය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිත නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට බලය සහිත සංස්ථාපිත ආයතනයක් විය යුත්තේ ය.

05. (1) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේ ය. අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

(2) නිල බලයෙන් පත්වන සාමාජිකයින් -

(අ) වයඹ පළාත් මාර්ගස්ථ ප්‍රවාහන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන විධායක මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු.

(ආ) වයඹ පළාත් ප්‍රධාන ලේකම් විසින් නම් කරනු ලබන විධායක මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු.

(ඇ) වයඹ පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන සහකාර පොලිස් අධිකාරි නිලයට නොඅඩු නිලධාරියෙකු.

(ඈ) වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු.

(ඉ) වයඹ පළාත් පාලන කොමසාරිස් හෝ ඔහු විසින් නම් කරන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු.

(3) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් -

(අ) ප්‍රවාහනය, නීතිය, කළමනාකරණය, වාණිජ්‍යය, පරිපාලනය හෝ සිවිල් ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එකක හෝ වැඩි ගණනක සුදුසුකම් ලබා ඇත්තා වූ ද එම විෂයන් පිළිබඳ මනා පලපුරුද්දක් හා දක්ෂතාවයක් දක්වා ඇත්තා වූ බවට විෂයභාර අමාත්‍යවරයා සෑහීමකට පත්වන පුද්ගලයින් හතර දෙනෙකු.

(4) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින් අමාත්‍යවරයාගේ අත්සනින් නිකුත් කරනු ලබන ලිපියක් මගින් විධිමත්ව පත් කරනු ලැබිය යුතු වන්නේ ය.

06. (1) ඉහත 3 (අ) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජිකයින් අතරින් එක් සාමාජිකයෙකු අමාත්‍යවරයා විසින් සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුත්තේ ය. අධිකාරියේ සභාපති

(2) සභාපතිවරයාගේ ධූර කාලය ඔහු අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලසීමාව හෝ අමාත්‍යවරයාගේ ප්‍රසාදය ඇතිතාක් කල් විය යුතු වන්නේ ය.

(3) මෙම ප්‍රඥප්තියේ 11 වැනි වගන්තියෙහි සඳහන් කර ඇති හේතුවක් නිසා, සභාපතිවරයාට සිය ධූරයේ කටයුතු ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක සභාපතිවරයා ලෙස වැඩ බැලීම පිණිස වෙනත් සාමාජිකයෙකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැක්කේ ය.

07. යම් තැනැත්තෙකු, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වීම සඳහා නුසුදුසුකම්.

(1) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, යම් පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු නම්,

(2) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු සහ වයඹ පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු නොවන්නේ නම්,

(3) පිළිගත් වෛද්‍ය මණ්ඩලයකින් සිහිවිකල් තැනැත්තෙකු බවට තීරණය කරනු ලැබ ඇත්නම් හෝ පූර්ණ අකර්මන්‍යතාවයකට පත්ව ඇත්නම්,

(4) ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක් විසින් වසර දහයකට (10) වැඩි කාලයකට අපරාධමය දණ්ඩනයකට යටත් කරනු ලැබ සිටින්නෙකු නම්,

(5) මෙම ප්‍රඥප්තියේ 15 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීමට නුසුදුස්සන් වූ අයෙක් නම්,

එම තැනැත්තා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමටත් පත් කර සිටී නම් දිගටම ක්‍රියා කිරීමටත් නුසුදුස්සෙකු වන්නේ ය.

සාමාජිකයන්ගේ මූල්‍ය සම්බන්ධතා සහ බැඳියාවන්

08. (1) අමාත්‍යවරයා විසින් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් යම් තැනැත්තෙකු පත්කිරීමට පෙර එම තැනැත්තා විසින් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් තම කර්තව්‍ය ඉටු කිරීමේ දී අහිතකර බලපෑමක් ඇතිවීමට ඉඩ ඇති අධිකාරියේ කටයුතු වලට අදාළ මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවයක් එම තැනැත්තාට නොමැති බවට අමාත්‍යවරයා සෑහීමකට පත් විය යුත්තේ ය.

(2) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු එම ධූරයට පත් කරනු ලැබීමෙන් පසු එවැනි යම් සම්බන්ධතාවයක් අත්කරගෙන නොමැති බවට අමාත්‍යවරයා කලින් කල සෑහීමකට පත්විය යුත්තේ ය.

(3) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබූ යම් තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් තත්කාර්ය සඳහා ඉල්ලීමක් කරනු ලබන කවර හෝ අවස්ථාවක දී මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා අවශ්‍ය යැයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන යම් තොරතුරක් ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(4) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇති කර ගනු ලබන හෝ ඇති කර ගැනීමට යෝජිත යම් ගිවිසුමක් පිළිබඳව යම් ආකාරයකින් සෘජුව හෝ අන්‍යාකාරයකට උනන්දුවක් දක්වන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු විසින් තමාගේ සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳව අධිකාරියේ රැස්වීමක දී හෙළිදරව් කළ යුතු අතර, එසේ හෙළිදරව් කිරීම අධිකාරියේ රැස්වීම් වාර්තාවල වාර්තා ගත කළ යුතු අතර, එම ගිවිසුම සම්බන්ධයෙන් අධිකාරිය විසින් පවත්වනු ලබන යම් සාකච්ඡාවකට හෝ අධිකාරිය විසින් ගනු ලබන යම් තීරණයකට එම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා සහභාගී නොවිය යුත්තේ ය.

අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්.

09. (1) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම රැස්වීමකදී ම සභාපතිවරයා මුලසුන දැරිය යුත්තේ ය. සභාපතිවරයා යම් රැස්වීමකට පැමිණ නොමැති අවස්ථාවකදී පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් යම් තැනැත්තෙකු එම රැස්වීම සඳහා සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගත යුත්තේ ය.

(2) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක ගණපූර්ණය තිදෙනෙකු විය යුත්තේ ය.

(3) අධිකාරිය විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් වන සෑම කරුණක්ම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී තීරණය කළ යුතු අතර, එම කරුණු රැස්වීමට පැමිණ ඡන්දය පාවිච්චි කරන අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ බහුතරයක් විසින් අනුමත කරනු ලැබිය යුත්තේ ය.

(4) යම් අවස්ථාවක දී යම් යෝජනාවක් සම්බන්ධයෙන් පක්ෂව හා විපක්ෂව සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබී ඇත්නම්, එවැනි අවස්ථාවක දී සභාපතිවරයාට තීරක ඡන්දයක් හිමි විය යුතු වන්නේ ය.

(5) යම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු තෝරාපත් කර ගැනීමෙහිලා හෝ පත්කිරීමෙහිලා යම් දෝෂයක් තිබුණ බවට හෝ එවැනි සාමාජිකයෙකු නුසුදුස්සෙකු වූ බවට පසුව සොයා ගනු ලැබුවහොත් එම තැනැත්තාට සුදුසුකම් තිබූ ලෙස සලකා ඔහු සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙහි කරන ලද සියලු ක්‍රියා වලංගු විය යුත්තේ ය.

(6) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා ම පමණක් යම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුත්තේ ය.

(7) අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් මසකට වරක්වත් රැස්විය යුත්තේ ය. රැස්වීම අවශ්‍ය යයි අධිකාරියේ සභාපතිවරයා සලකන ඕනෑම අවස්ථාවක දී හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් තුන්දෙනෙකු විසින් ලිඛිත ඉල්ලීමක් කර ඇති අවස්ථාවක දී හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් සභාපතිවරයා විසින් කැඳවිය යුත්තේ ය.

(8) මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත් ව අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් හා ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය සම්බන්ධව කාර්ය විධානයකට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රීති සෑදිය හැක්කේ ය.

10. (1) නියමිත කාලයට පෙර තනතුර අත්හැරිය හොත් හෝ මෙම ප්‍රඥප්තියේ 12 හෝ 13 වන වගන්ති යටතේ අමාත්‍යවරයා විසින් තනතුරෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයකුම තම පත්වීමේ දිනයෙහි සිට අවුරුදු තුනක කාලයක් ධුරය දරන්නේ ය. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ ධුර කාලය

(2) එසේවුවද වුවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පිරවීමට පත් කළ සාමාජිකයෙකු ධුරය දරන්නේ තම පූර්වගාමියාගේ ධුර කාලයේ ඉතිරි කාල පරිච්ඡේදය සඳහා පමණි.

11. අසනීප නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ සිය රාජකාරී ඉටු කිරීමට යම් සාමාජිකයෙකු තාවකාලිකව අපොහොසත් වේ නම් එම කාලසීමාව සඳහා මෙම ප්‍රඥප්තියේ 5 වන හා 7 වන වගන්තිවල සඳහන් විධිවිධානයන්ට යටත්ව අමාත්‍යවරයා විසින් සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීමට වෙනත් අයකු පත්කළ හැක්කේ ය. අධ්‍යක්ෂ මණ්ඩලයේ වැඩ බලන සාමාජිකයින් පත් කිරීම.

12. අමාත්‍යවරයා වෙත තත්කාර්ය සඳහා කරන ලිඛිත දැන්වීමක් මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කවර හෝ සාමාජිකයකුට කවර අවස්ථාවක වුවද සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැක්කේ ය. ඉල්ලා අස්වීම.

13. (1) අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියේ 5(4) වන උපවගන්තිය යටතේ පත්කළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ඕනෑම අවස්ථාවක හේතු නොදක්වා ධුරයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයාට හැක්කේ ය. ධුරයෙන් ඉවත් කිරීම.

(2) මෙම ප්‍රඥප්තියේ 5(2)(අ) සිට (ඉ) දක්වා වන උපවගන්ති යටතේ නිල බලයෙන් පත්කළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ඉවත් කරනු ලබන්නේ නම් එම සාමාජිකයා නිර්දේශ කළ ආයතන ප්‍රධානියාගේ එකඟතාවයෙන් අමාත්‍යවරයාට එම සාමාජිකයා ධුරයෙන් ඉවත් කළ හැක්කේ ය.

14. අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයකු සභාපතිවරයාට දැනුම් දීමකින් තොරව අඛණ්ඩව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර තුනකට සහභාගි නොවුවහොත් එම සාමාජිකයාගේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය අහෝසි වන්නේ ය. ධුරය අහෝසි වීම.

නැවත පත් කිරීම.

15. ධුර කාලය අවසන් වීමෙන් පසු සාමාජිකත්වය අහෝසි වන සාමාජිකයෙකු ද, සිය කැමැත්තෙන් හෝ ධුර කාලය තුළ ඉල්ලා අස්වූ සාමාජිකයෙකු ද නැවත පත්කරනු ලැබිය හැක්කේ ය. එතකුදු වුවත් මෙම ප්‍රඥප්තියේ 13 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබූ සාමාජිකයෙකු හෝ මෙම ප්‍රඥප්තියේ 14 වන වගන්තිය යටතේ සාමාජිකත්වය අහෝසි වූ සාමාජිකයෙකු නැවත පත්වීමට සුදුස්සෙකු නොවේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සඳහා පාරිශ්‍රමික හා දීමනා

16. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට හා සභාපතිවරයාට පළාත් අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා පළාත් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැක්කේ ය.

පළාත් අධිකාරියේ පොදු මුද්‍රාව

17. (1) පළාත් අධිකාරියට පොදු මුද්‍රාවක් තිබිය යුත්තේ ය. එම මුද්‍රාව සාමාන්‍යාධිකාරිවරයා භාරයේ තැබිය යුත්තේ ය.

(2) පළාත් අධිකාරියේ මුද්‍රාව පළාත් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට වෙනස් කර ගත හැක්කේ ය.

(3) පළාත් අධිකාරියේ මුද්‍රාව පළාත් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කිසිම ලේඛනයකට හෝ සාධන පත්‍රයකට හෝ නොතැබිය යුත්තේ ය. ඒ සාමාජිකයින් දෙදෙනාගෙන් එක් සාමාජිකයකු පළාත් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා විය යුත්තේ ය. තමන් ඉදිරිපිට දී මුද්‍රාව තැබූ බවට සාක්ෂියක් වශයෙන් එම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනාම ඒ ලේඛනයට හෝ සාධන පත්‍රයට හෝ අත්සන් තැබිය යුත්තේ ය.

## II වන කොටස

## පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ බලතල හා කාර්යයන්

මගී ප්‍රවාහන සේවා සම්බන්ධ බලතල

18. වයඹ පළාත ඇතුළත මගී ප්‍රවාහන අවශ්‍යතාවලට සරිලන මනා තත්ත්වයක බස් සේවයක් පවතින්නේ ද යන්න පිළිබඳව සොයා බැලීම සහ ධාවන කාලසටහන් පිළියෙල කිරීම හා ධාවකයින් එම කාලසටහන් පිළිපදින බවට වගබලා ගැනීමට පියවර ගැනීම හා වයඹ පළාත තුළ මගී ප්‍රවාහනය සඳහා බස් රථ යෙදිය යුතු මාර්ග අනුමත කිරීම, වර්ග කිරීම හා මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වන මාර්ග හැර සෙසු මාර්ගවල නැවතුම්පළවල් ඉදිකරන ස්ථාන තීරණය කිරීම.

මාර්ග බලපත්‍ර නිකුත් කිරීම.

19. (1) පළාත තුළ මගී ප්‍රවාහන අවශ්‍යතාවය සපුරාලීම හා විධිමත් කිරීම සඳහා, බස්රථ පාවිච්චි කිරීමට බලය ලබාදෙන මාර්ග බලපත්‍ර නිකුත් කිරීම එම බලපත්‍ර අලුත් කිරීම හෝ සංශෝධනය කිරීම, අවලංගු කිරීම හා කාලය දීර්ඝ කිරීම සහ අයිතිය විධිමත් කිරීම, එම බලපත්‍ර සඳහා ගාස්තු නියම කිරීම.

(2) මගී ප්‍රවාහනය සඳහා බස්රථ පාවිච්චි කිරීමට බලය ලබාදෙන මාර්ග බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද, බලපත්‍රලාභීන් ඒ කොන්දේසි පිළිපදින බවට වගබලා ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.

(3) මගී ප්‍රවාහනය සඳහා බස්රථ පාවිච්චි කිරීමේ දී බස්රථයේ ගමන් ගන්නා සෑම මගියෙකුට ම කොන්දොස්තරවරයකු විසින් අනිවාර්යයෙන් ම ප්‍රවේශපත්‍රයක් නිකුත් කළ යුතු බවට වගබලා ගැනීම.

20. පළාත තුළ මගී ප්‍රවාහන සේවයේ යොදවනු ලබන මෝටර් වාහනයක බලපත්‍රලාභියා විසින් පවත්වාගෙන යායුතු ගුණාත්මකභාවය සහ යෝග්‍යතාවය පිළිබඳව වෙනත් නීතියක් මගින් නියම කරන අවස්ථාවක මගී ප්‍රවාහනයට අත්‍යාවශ්‍ය වන ගුණාත්මකභාවය හා යෝග්‍යතාවය පිළිබඳ එම ප්‍රමිති ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීම.

මගී ප්‍රවාහන සේවා සඳහා යොදා ගන්නා වාහනවල යෝග්‍යතාවය හා ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රමිති

21. මෙම ප්‍රඥප්තිය යටතේ ඇති යම් අරමුණක් සඳහා අවශ්‍යවන්නා වූ තොරතුරු හා වාර්තා අධිකාරිය වෙත සපයන ලෙස මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ මාර්ග බලපත්‍රයක් ලබාගෙන, වයඹ පළාත තුළ හෝ වයඹ පළාත හරහා මගී ප්‍රවාහන සේවා කරනු ලබන තැනැත්තෙකුට නියම කිරීම.

තොරතුරු සැපයීම.

22. වයඹ පළාත තුළ හෝ වයඹ පළාත හරහා පළාත තුළ ගාස්තුවක්, ප්‍රතිලාභයක් හෝ ත්‍යාගයක් සඳහා පාසල් විශ්වවිද්‍යාල සහ වෙනත් අධ්‍යාපන ආයතනවල ශිෂ්‍යයන් ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ සංශෝධන කිරීම, අවලංගු කිරීම හා කාලය දීර්ඝ කිරීම, අයිතිය විධිමත් කිරීම හා අනුග්‍රාහක ගාස්තු මත අදාළ ප්‍රවාහනන බලපත්‍ර නිකුත් කිරීම.

පාසල් ළමුන් ප්‍රවාහනය කිරීම.

23. පළාත තුළ ගාස්තුවක්, ප්‍රතිලාභයක් හෝ ත්‍යාගයක් සඳහා බස්රථවලින් හෝ වෑන් රථවලින් කරනු ලබන කාර්යාල සේවක හා කර්මාන්තශාලා සේවක ප්‍රවාහනය කිරීමේ සේවා විධිමත් කිරීම. එහි මගී ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම, සංශෝධනය කිරීම, අවලංගු කිරීම හා කාලය දීර්ඝ කිරීම, අයිතිය විධිමත් කිරීම, එම බලපත්‍ර සඳහා ගාස්තු නියම කිරීම.

කාර්යාල සේවක හා කර්මාන්ත ශාලා සේවකයින් ප්‍රවාහනය කිරීම.

24. (1) වෙනත් පළාතකින් වයඹ පළාතට පිවිස, වයඹ පළාත තුළ හෝ වයඹ පළාත හරහා ගාස්තුවක්, ත්‍යාගයක්, ප්‍රතිලාභයක් හෝ වෙන් වෙන් ගාස්තු මත මගී ප්‍රවාහනයේ යෙදෙන මෝටර් වාහනවලින් සේවා ගාස්තු අය කිරීම, පාලනය කිරීම හා විධිමත් කිරීම.

අන්තර් පළාත් මගී ප්‍රවාහන සේවා.

(2) ජාතික ගමනාගමන කොමිෂන් සභාව හෝ වෙනත් ආයතන විසින් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව නිර්දේශ ඉල්ලා සිටින අවස්ථාවක දී, උචිත පරිදි නිර්දේශ ලබාදීම සහ මෙම අධිකාරියේ නිර්දේශයකින් තොරව නිකුත් කර ඇති බලපත්‍රයක් යටතේ ධාවනය වන බස් රථ සඳහා පිවිසුම් අවසරය ලබා නොදීම හා ඒ හා සම්බන්ධ නෛතික ක්‍රියාමාර්ග ගැනීම.

25. වයඹ පළාත තුළ මගී ප්‍රවාහන සේවාවේ වර්ධනය හා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම වෙනුවෙන් මගී ජනතාවට මෙන් ම ආයෝජකයින්ගේ සංවර්ධනය උදෙසා නව ව්‍යාපෘති හඳුන්වාදීම සහ ක්‍රියාවට නැංවීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ හා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මේ වෙනුවෙන් අදාළ අනුකම්ටු පිහිටුවීම.

නව ව්‍යාපෘති හඳුන්වා දීම හා අනුකම්ටු පිහිටුවීම.

26. පළාත ඇතුළත සියලු පොදු මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීමට බස් රථ ධාවනය සඳහා ලංකා ගමනාගමන මණ්ඩලය සමග ඒකාබද්ධ හෝ අධිකාරිය විසින් උචිත යැයි තීරණය කරනු ලබන, විද්‍යාත්මක කාලසටහන් නියම කිරීම, එම කාලසටහන් අනුව ධාවන කටයුතු කළ යුතු බවට සියලු ධාවකයන්ට නියම කිරීම හා උල්ලංඝනය කරන්නන් හා සම්බන්ධයෙන් ස්ථානීය සේවා ගාස්තු නියම කිරීම හා නෛතික ක්‍රියාමාර්ග ගැනීම.

කාලසටහන් නියම කිරීම.

27. අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රලාභී බස්රථයක ඇතුළත සහ පිට ප්‍රදර්ශනය කළ යුතු ගමනාරම්භ හා ගමනාන්ත නාම පුවරු සලකුණු හා සංකේත ත්‍රෛභාෂාවෙන් ම යෙදීම.

බස් රථ ගමන් කරන හා ගමනාන්ත නාම පුවරු ආදිය

රියදුරන්, කොන්දොස්තර, රිය සහායකයින් ලියාපදිංචි කිරීම.

28. අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් හෝ වෙනත් බලපත්‍රයක් යටතේ මඟී ප්‍රවාහනයේ යෙදෙන මෝටර් වාහනවල රියදුරන් කොන්දොස්තරවරුන් සහ රිය සහායකයින් ලියාපදිංචි කිරීම, හැඳුනුම්පත් නිකුත් කිරීම, ඒ සඳහා ගාස්තු අය කිරීම ලියාපදිංචිය අවලංගු කිරීම, අලුත් කිරීම, අත්හිටුවීම.

හදිසි පරීක්ෂණ කණ්ඩායම්.

29. පළාත ඇතුළත හා පළාත හරහා ධාවනය කරන මෙම ප්‍රඥප්තියේ දක්වන වාහනවල මඟී ප්‍රවාහනයට සම්බන්ධ මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන ක්‍රියාවන් සෙවීම, වැළැක්වීම සහ ඒවාට විරුද්ධව ක්‍රියා කිරීම අරමුණු කොට හදිසි පරීක්ෂණ කණ්ඩායම් ස්ථාපනය කිරීම හෝ ස්ථාපනය කරවීම හෝ එකී කණ්ඩායම්වල බලතල සහ කාර්යයන් නියම කිරීම.

මඟී ප්‍රවාහන සේවා මාර්ග හඳුනා ගැනීම හා ඒවායේ ධාවනය කළ යුතු මෝටර් වාහන නියම කිරීම.

30. පළාත තුළ වෙන් වෙන් ගාස්තු මත ප්‍රවාහන සේවාවන් පවත්වාගෙන යා හැකි මාර්ගයන් හඳුනා ගැනීම, වර්ග කිරීම සහ එකී එක් එක් මාර්ගයන්හි මඟී ප්‍රවාහන සේවා කටයුතු සඳහා පාවිච්චි කළ යුතු බස් රථ සහ වෙනත් මෝටර් වාහන වර්ගය හා ප්‍රමිතිය නියම කිරීම.

ගිවිසුම් හා කොන්ත්‍රාත්.

31. අධිකාරියේ අරමුණු පරමාරථ සහ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන වයඹ පළාත් සභාවේ රීති සහ පළාත් සභාව විසින් අනුමත කළ වෙනත් යම් නීතියක නියමයන්ට යටත්ව ශ්‍රී ලංකාව තුළ යම් ආයතනයක් සමග ගිවිසුම් සහ කොන්ත්‍රාත්තුවලට එළඹීම සහ එකී අරමුණු පරමාර්ථ සහ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා වෙනත් ආයතන සමග සම්බන්ධ වීම.

අනුග්‍රහ සහ ප්‍රදාන.

32. මුදල්මය වශයෙන් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ අන්‍යාකාරයෙන් හෝ ප්‍රදාන, අනුග්‍රහ පිළිගැනීම සහ මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපාදනයන්ට යටත්ව අධිකාරියේ අරමුණු අරභයා ඒවා යොදා ගැනීම.

රියදුරු, කොන්දොස්තර හා රිය සහායකයින් පුහුණු කිරීම.

33. රියදුරන්, කොන්දොස්තරවරුන් සහ රිය සහායකයින් පුහුණු කිරීම සඳහා මෝටර් රථ දෙපාර්තමේන්තුවේ අනුමත රියදුරු පුහුණු පාසල් ආරම්භ කිරීම, පුහුණු පාඨමාලා පැවැත්වීම, පසු විපරම් කිරීම.

පළාතේ බස් නැවතුම්පොළවල් පරිපාලනය, කළමනාකරණය හා වෙනත් බලතල.

34. අධිකාරියට පළාත් තුළ පිහිටි බස්රථගාල් හා මාර්ගස්ථ නැවතුම් ස්ථාන සම්බන්ධයෙන් පහත සඳහන් බලතල ක්‍රියාත්මක කළ හැක්කේ ය.

(1) බස්රථ ගාල් හා මාර්ගස්ථ නැවතුම් ස්ථාන පිහිටුවීම, නඩත්තු කිරීම, වසා දැමීම, කළමනාකරණය, සංවර්ධනය කිරීම, වෙනස් කිරීම නීත්‍යානුකූලව අත්පත් කර ගැනීම.

(2) බස් නැවතුම්පොළවල බස්රථ ධාවන කළමනාකරණ කටයුතු කාලසටහන් නියම කිරීම මෙන් ම එකී කළමනාකරණ කටයුතු සඳහා අවශ්‍ය අධිකාරියේ කාර්ය මණ්ඩල යෙදවීම සහ ඔවුන්ගේ බලතල කාර්යයන් හා වගකීම නියම කිරීම සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීම, බස් නැවතුම්පොළවල අධිකාරියේ කාර්ය මණ්ඩලය විසින් පවත්වාගෙන යායුතු වාර්තා සහ ලිපිලේඛන හා ඒවායේ සටහන් කළ යුතු තොරතුරු නියම කිරීම.

(3) අධිකාරිය විසින් පරිපාලනය හා කළමනාකරණය කරගෙන යනු ලබන බස්නැවතුම්පොළවල පරිපාලනය හා ප්‍රවාහන සේවා කටයුතුවලට බාහිර පාර්ශවයන් සම්බන්ධ කර ගැනීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ නිර්ණායක තීරණය කිරීම.

(4) විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව අධිකාරියේ කාර්යයන් සඳහා යම් චංචල දේපළක් මිලදී ගැනීම, බද්දට හෝ කුළියට දීම/ ගැනීම, බැහැර කිරීම හා නිශ්චල දේපළක් මිලදී ගැනීම, බද්දට දීම හෝ කුළියට දීම.

(5) මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ බලතල කාර්ය සහ කර්තව්‍ය කාලීන අවශ්‍යතා මත ඉටුකිරීම සහ කරවීම සඳහා අවශ්‍ය යැයි අධිකාරියට හැඟෙන මෙම ප්‍රඥප්තියේ සඳහන් වෙනත් බලතල ක්‍රියාත්මක කිරීම.

## III වැනි කොටස

### පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ කාර්ය මණ්ඩලය

35. (1) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කළ බඳවා ගැනීමේ පටිපාටියක් අනුව අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව අධිකාරිය සඳහා සාමාන්‍යාධිකාරිවරයකු පත් කරනු ලැබිය යුත්තේ ය. අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා

(2) අධිකාරියේ එදිනෙදා වැඩ කටයුතු මෙහෙයවීම ද, අධිකාරියේ සේවා නියුක්තයන් පිළිබඳ පරිපාලනමය පාලනය ද, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාන්‍ය විධානයට හා පරිපාලනයට යටත්ව සාමාන්‍යාධිකාරිවරයාට භාර කරනු ලැබිය යුතු අතර, සාමාන්‍යාධිකාරිවරයා එම බලතල අධ්‍යක්ෂ මණ්ඩලයේ මග පෙන්වීම හා පාලනයට යටත්ව ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(3) තමාගේ බලතල කර්තව්‍ය හෝ කාර්යය අතුරින් අධිකාරියේ වෙනත් යම් සේවා නියුක්තියකුට පැවරීම අවශ්‍ය යැයි සාමාන්‍යාධිකාරිවරයා කලින් කල සලකන, බලතල කර්තව්‍ය හෝ කාර්යය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලිඛිත අනුමැතිය ඇතිව සාමාන්‍යාධිකාරිවරයා විසින් ලිඛිතව ඒ සේවා නියුක්තිකයාට පැවරිය හැකි අතර, එවැනි යම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය එසේ පවරනු ලැබූ යම් සේවා නියුක්තයකු විසින් සාමාන්‍යාධිකාරිවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ඒවා ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(4) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරිවරයා ධූරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුත්තේ ය.

36. (1) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පත්වීම් ආදිය

(අ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන කාර්යය මණ්ඩලයන් පත්කිරීම සහ එම කාර්යය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය පවත්වාගෙන යාම.

(ආ) එම කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම.

(ඇ) එම කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම් කළ හැකි ය.

(2) වයඹ පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ තාවකාලික හෝ ස්ථිර හෝ තනතුරකට පත් කිරීමට අවශ්‍ය යැයි අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී නිලධාරියාගේ කැමැත්තද/ අදාළ පත්වීම් බලධාරියාගේ සහ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය ද ඇතිව පත්කළ හැකි ය.

(3) අධිකාරියේ ඉල්ලීමපිට රජයේ සේවයේ යම් නිලධාරියකු එම නිලධාරියාගේ ද, එම නිලධාරියා සේවයේ නියුක්ත කරවනු ලැබ සිටියේ යම් අමාත්‍යාංශයක් විසින් ද නැතහොත් අමාත්‍යාංශයක් යටතේ ද එම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේද රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේද කැමැත්ත ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව, නිශ්චය කරනු ලබන කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබිය හැකි ය.

(4) නිශ්චිත කාලසීමාවක් රජයට හෝ පළාත් සභාවකට හෝ සේවය කිරීමට එකඟ වෙමින් රජය හෝ පළාත් සභාවක් සමඟ හෝ ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තෙකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා අධිකාරියට සේවය කරන යම් සේවා කාලයක් රජයේ හෝ පළාත් සභාවේ එකඟත්වයට යටත්ව, ඒ ගිවිසුමේ බැඳීම ඉටුකිරීමේ කාර්යය සඳහා රජයට හෝ එම පළාත් සභාවට හෝ කරනු ලබන සේවයක් ලෙස සැලකිය යුත්තේ ය.

## IV වැනි කොටස

## මුදල්

අධිකාරියේ අරමුදල

37. (1) අධිකාරියට ''වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අරමුදල'' නමින් අරමුදලක් තිබිය යුතු ය.

(2) අධිකාරියේ අරමුදලට පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතු ය.

(අ) මගී ප්‍රවාහන සේවා බලපත්‍ර නිකුත් කිරීම සහ අලුත් කිරීම මත අය කරනු ලබන මුදල් හා ස්වකීය බලතල කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටුකිරීමේ දී පළාත් අධිකාරියට ලැබෙන අනෙකුත් සියලු මුදල්.

(ආ) වයඹ පළාතේ, පළාත් සභාවෙන් ලැබෙන ප්‍රතිපාදන මුදල් ද ඇතුළුව අධිකාරියේ අරමුදලට බැර වන සියළු මුදල්.

(3) මෙම අරමුදල නිසි පරිදි පරිපාලනය කිරීම හා ගිණුම් ගත කිරීම සාමාන්‍යාධිකාරිවරයා සතු වගකීමකි. මෙම අරමුදල නිසි පරිදි පරිපාලනය කිරීම හා ගිණුම් ගත කිරීම සඳහා බලය කාර්ය මණ්ඩලයට පැවරීමට සාමාන්‍යාධිකාරිවරයාට හැකියාව පවතී.

(4) මෙම ප්‍රඥප්තිය සහ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම වෙනුවෙන් අධිකාරියේ සාමාජිකයින්ට හා අධිකාරියේ සේවා නියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවීම සඳහා පළාත් අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් දරනු ලබන වියදම් ගෙවීමේ කාර්ය සඳහා සහ කලින් කල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය දෙනු ලැබිය හැකි වෙනත් කාර්යය සඳහාද අධිකාරිය විසින් අධිකාරියේ අරමුදල් උපයෝගී කරගත හැක.

අධිකාරියේ ණය ගැනීමේ බලතල

38. මෙම ප්‍රඥප්තිය යටතේ, වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ කාර්ය ඉටු කිරීමේ දී සිය වගකීම ඉටු කිරීම සඳහා අරමුදලේ මුදල්වලට අමතරව, අවශ්‍ය වනු ලබන මුදල්, පළාත් සභාවේ විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය හා මුදල් විෂයභාර අමාත්‍යංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව හෝ ඔවුන් විසින් දෙන ලද පොදු අවසරයකට, නියමයන්ට අනුකූලව වයඹ පළාත් සභා අරමුදලෙන් හෝ රාජ්‍ය බැංකු අයිරාවක් මගින් හෝ අධිකාරිය විසින් ණයට ගත හැකි ය.

39. (1) ප්‍රවාහන සේවා අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. අධිකාරියේ ගිණුම්.

(2) පළාත් අධිකාරියේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියළු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීම අධිකාරිය විසින් සිදු කළ යුතු ය.

(3) අධිකාරිය විසින් ඉටුකරන ලද කාර්යයන් පිළිබඳ වාර්ෂික වාර්තාවක් අධිකාරිය විසින් සකස්කළ යුතු ය.

(4) අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ විගණන වාර්තාව අමාත්‍යවරයා විසින් අදාළ මුදල් වර්ෂය ඉකුත් වී මාස 06 ක් ගතවීමට පෙර පළාත් සභාවෙහි සභාගත කළ යුතු ය.

(5) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වගන්තිය පරිදි පළාත් සභා අරමුදල් විගණනය කිරීම හා ගිණුම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාව අදාළ කර ගත යුතුය.

## V වැනි කොටස

## පොදු විධිවිධාන

40. (1) අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තිය විධි විධාන ක්‍රියාත්මක කිරීමේ සහ බලාත්මක කිරීමේ කාර්ය සඳහා මේ ප්‍රඥප්තියෙන් බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කරුණු හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයේ අමාත්‍යවරයා විසින් නියෝග පනවනු ලැබිය හැකි ය. ප්‍රඥප්තියේ නියෝග සෑදීම.

(2) ඉහත 40(1) වන උප වගන්තිය මගින් පිරිනමනු ලබන බලතලවල පොදුභාවයට අගතියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින් පහත සඳහන් සියළු හෝ එක් එක් කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(අ) මේ ප්‍රඥප්තිය යටතේ නියෝග සෑදීම සඳහා නියමිත හෝ බලය දෙනු ලබන සියළු කාරණා.

(ආ) බලපත්‍ර සහ වෙනත් අධිකාර නිකුත් කිරීම, අළුත් කිරීම, සංශෝධනය කිරීම, අයිතිය විධිමත් කිරීම හා ඊට ආනුෂංගික කටයුතුවලදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සහ භාවිතා කළ යුතු ආකෘති සහ ගෙවිය යුතු ගාස්තු නියම කිරීම.

(ඇ) මාර්ගවල යෝග්‍යතාවය සහ භාවිතය අනුව එකී මාර්ගයන්වල ගාස්තු මත මගී ප්‍රවාහනය සඳහා පාවිච්චි කළ යුතු මෝටර් වාහන නියම කිරීම සහ එකී මෝටර් වාහන පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පිළිපැදිය යුතු සම්මතයන් නියම කිරීම.

(ඈ) බලපත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන වාහනයක රියදුරු, කොන්දොස්තර, රිය සහායක හෝ වාහනය භාරව සිටින තැනැත්තා විසින් රැගෙන යායුතු ලේඛණ සහ ඒවායේ ඇතුළත් විය යුතු සහ ඇතුළත් කළ යුතු විස්තර,

(ඉ) නිත්‍ය මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස්රථවල ගමන් වාර සම්බන්ධයෙන් තබා ගත යුතු වාර්තා,

(ඊ) බලපත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන වාහනයක් පාවිච්චි කරනු ලබන යම් තැනැත්තෙකු විසින් පිළිපැදිය යුතු සම්මතයන්,

(උ) නිත්‍ය මගී හා ප්‍රවාහන සේවා බලපත්‍ර දරන්නන් විසින් ඒවා බලපත්‍රවල බලය යටතේ යොදා ගනු ලබන බස්රථවල රියදුරන්, කොන්දොස්තරවරුන් හා රිය සහායකයින් ලෙස සේවා නියුක්ත කරනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් සහ ඒ තැනැත්තන් සේවය ආරම්භ කරන හා අවසන් කරන වේලාව සහ ඔවුන් විසින් ගනු ලබන විවේක කාලයන් සම්බන්ධයෙන් ඒ බලපත්‍ර දරන්නන් විසින් තබා ගත යුතු වාර්තා,

(ඌ) එසේ තබා ගනු ලබන වාර්තා සුරක්ෂිතව තබා ගැනීම අධිකාරිය විසින් බලය දෙන ලද තැනැත්තකු විසින් ඉල්ලා සිටින විට ඒ වාර්තා පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම.

(එ) බලපත්‍රවල අධිකාරිය යටතේ මගී ප්‍රවාහනයේ යෙදෙන රියදුරන්, කොන්දොස්තරවරුන් සහ රිය සහයකයින් ලියාපදිංචි කිරීම, එම ලියාපදිංචිය අළුත් කිරීම, අවලංගු කිරීම සහ අත්හිටුවීම් සම්බන්ධයෙන් කාර්යය පටිපාටිය සැකසීම.

(ඒ) අධිකාරියේ බලතල කාර්යයන් හා කටයුතු කළමණාකරණය කිරීම සහ මගී ප්‍රවාහන සේවයේ යෙදෙන සියළු සේවකයන්ට අදාල අවම වැටුප්, නිවාඩු සහ සේවක වරප්‍රසාද පිළිබඳව.

(ඔ) බලපත්‍රවල අධිකාරිය යටතේ නිත්‍ය මගී ප්‍රවාහන සේවයේ යෙදෙන මෝටර් වාහනවල රියදුරන් සහ කොන්දොස්තරවරුන් විසින් පැළඳ සිටිය යුතු/ නිළ ඇඳුම් සහ ලාංඡන නියම කිරීම, එම වාහනවල රියදුරන්, රිය සහායකයින් සහ කොන්දොස්තරවරුන් මගී ප්‍රවාහනයේ යෙදෙන අවස්ථාවලදී ඔවුන් විසින් අනුගමනය කළ යුතු විනය නීති නියම කිරීම.

(ඕ) විශේෂයෙන් ම බස් ධාවනය ඒකාබද්ධ කිරීම හා වේලාවන් සටහන් කිරීම සහ පහසුකම් නිසි පරිදි සහ සාධාරණ ලෙස සැලසීම සඳහා බස්රථ ගාල්, බස් නැවතුම්පොළවල් හා මාර්ගස්ථ නැවතුම් ස්ථාන කළමනාකරණය කිරීම සම්බන්ධව.

(ක) පළාත තුළ මගී ප්‍රවාහන බලපත්‍රයක් හෝ යම් අධිකාරි බලයක් යටතේ ධාවනය කරනු ලබන පාසල් වෑන් රථ, කුලී රථ සඳහා වෙනත් නීතියක් යටතේ ආවරණය නොවන මගී ප්‍රවාහන සේවා සඳහා අය කළ යුතු ගාස්තු නියම කිරීම, නිශ්චය කිරීම හා ඒවා සංශෝධනය කිරීම.

(ග) නිත්‍ය මගී ප්‍රවාහන සේවා සහ විශේෂ මගී ප්‍රවාහන සේවා බලපත්‍රවල බලය යටතේ යොදා ගනු ලබන රියදුරන්, රිය සහායකයින්ගේ හා කොන්දොස්තරවරුන්ගේ අවම සුදුසුකම් නියම කිරීම සහ ඔවුන්ගේ ශාරීරික සහ මානසික යෝග්‍යතා කලින් කල පරීක්ෂණයට භාජනය කරවීම.

(ජ) අන්තර් පළාත් බලපත්‍රලාභී බස්රථ වයඹ පළාත තුළ මගී ප්‍රවාහනයේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හා ගාස්තු අය කිරීම පිළිබඳව රෙගුලාසි පැනවීම.

(3) මෙහි 40(1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ සඳහන් වන යම් පසු දිනක හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

(4) මෙහි (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ඒවා *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ ඉදිරිපත් කිරීමෙන් පසු අනුමත නොකරන ලද යම් නියෝගයක් වෙතොත් එය යටතේ කලින් කරන ලද ක්‍රියාවකට හානියක් නොමැතිව අනුමත දින සිට එම නියෝගය පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය *ගැසට් පත්‍රයේ* පල කරනු ලැබිය යුතු ය.

41. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 04 දරන වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය අවලංගු වන්නේ ය. මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය අවලංගු කිරීම.

## VI වැනි කොටස

### සාමාන්‍ය විධිවිධාන

42. (1) අධිකාරිය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අධිකාරියට කලින් කලට පොදු හෝ විශේෂ විධිවිධාන නිකුත් කරනු ලැබිය හැකි වන අතර අධිකාරිය ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය. විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

(2) අධිකාරියේ කටයුතු සම්බන්ධයෙන් තමා විසින් නියම කරනු ලබන ආකෘතියකින් තමා වෙත වාර වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කලට අධිකාරියට විධාන කරනු ලැබිය හැකි වන අතර, අධිකාරිය විසින් ඒ සෑම විධානයක් ම ඉටුකළ යුතු ය.

43. අධිකාරිය විසින් බලය දෙන යම් තැනැත්තෙකු විසින් කවර හෝ වේලාවක වයඹ පළාත ඇතුළත කවර හෝ ස්ථානයක දී, වාහනයට ඇතුළු වීම සහ සෝදිසි කිරීම.

(1) මගී ප්‍රවාහන සේවාවේ යෙදෙන යම් මෝටර් වාහනයක ඒ සඳහා වන අවසරය මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ආයතනයකින් ලැබ ඇත් ද යන වග එම බලපත්‍රයට අදාළ කොන්දේසි එකී වාහනයේ රියදුරු, කොන්දොස්තර, රිය සහායක හෝ භාරව සිටින තැනැත්තා විසින් පිළිපැද ඇත් ද, යන්න ප්‍රඥප්තියේ විධාන හෝ රෙගුලාසි පිළිපැද ඇත් ද යන්න දැන ගැනීම සඳහා එකී වාහනයට ඇතුල්වීම හෝ වාහනය සෝදිසි කිරීම කළ හැකි ය.

(2) මගී ප්‍රවාහනය සඳහා අදාල වාහනයට අධිකාරිය විසින් නිකුත් කර ඇති බලපත්‍රය ඉදිරිපත් කරන ලෙසට එම වාහනයේ රියදුරුට, කොන්දොස්තරට හෝ රිය සහායකට හෝ භාරව සිටින්නාට නියම කළ හැක.

(3) ඒ බලපත්‍රය හෝ වෙනත් ලේඛන හෝ එහි පිටපත් තමන්ගේ භාරයට ගත හැකි ය.

(4) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන රියදුරු බලපත්‍රය වාර්ෂික ආදායම් බලපත්‍රය හා අදාළ යැයි හැඟෙන වෙනත් ලියකියවිලි පරීක්ෂා කළ හැකි ය.

නඩු පවරනු ලැබීමෙන් ආරක්ෂාව.

44. (1) (අ) අධිකාරිය විසින් මේ ප්‍රඥප්තිය යටතේ කරනු ලැබූ හෝ කරන ලදැයි කියනු ලබන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව *නැතහොත්,*

(ආ) අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයෙකු විසින් මේ ප්‍රඥප්තිය අධිකාරිය යටතේ හෝ අධිකාරියේ කරනු ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිදු සිවිල් නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අධිකාරියට එරෙහි වූ යම් සිවිල් නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. එවැනි සිවිල් නඩුවකින් අධිකාරිය විසින් අය කර ගනු ලබන යම් වියදමක් හෝ වන්දියක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. අදාළ වරදට සම්බන්ධ නිලධාරියා මෙම ප්‍රඥප්තිය හෝ අධිකාරිය විසින් පනවල ලද නීති/ රෙගුලාසි උල්ලංඝනය කර ඇති අවස්ථාවක ඔහු ඒ සම්බන්ධයෙන් පෞද්ගලිකව වගකිව යුතු අතර, අදාළ මුදල අධිකාරියේ අරමුදලින් ගෙවීම සම්බන්ධයෙන් තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන්නේ ය.

ස්ථානීය සේවා ගාස්තු.

45. (1) අධිකාරිය විසින් බලය පවරනු ලැබූ යම් නිලධාරියකු විසින් හෝ මේ ප්‍රඥප්තිය යටතේ වන බලපත්‍රයක අධිකාරිය යටතේ මඟී ප්‍රවාහන කරන මෝටර් රථයකට අදාල මෙම ප්‍රඥප්තියේ නියමිත විධි විධාන කිසිවක් කඩකර ඇති විටක දී එකී කඩකිරීම පිළිබඳ වගකීම සිය කැමැත්තෙන් පිළිගන්නා යම් තැනැත්තෙකු විසින් එකී කඩකිරීම සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීම වෙනුවට වලංගුව පවතින්නා වූ උපරිම ස්ථානීය සේවා ගාස්තුවකට යටත්ව සේවා ගාස්තුව නියම කරනු ලැබිය හැකි ය. ඒ පිළිබඳව බලය පවරනු ලැබූ නිලධාරියා විසින් හෝ එකී නිලධාරියා විසින් සුදුසු පරිදි ධාවන මාර්ගය හා මෝටර් වාහනයේ අංකය ද සහිතව අධිකාරියට දැන්විය යුතු වේ.

(2) එවැනි ස්ථානීය සේවා ගාස්තුවක් අධිකාරිය වෙත හෝ අධිකාරියේ උප කාර්යාලයකට අධිකාරියේ අරමුදලට බැරවන සේ ගෙවා, ගෙවීම් සාක්ෂි වශයෙන් වරද සොයාගත් දින සිට දෙසතියක් තුළ අදාළ ලදුපත අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ධාවන බලපත්‍ර ප්‍රදර්ශනය කළ යුතු ය.

46. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම එම බලපත්‍රය නිකුත් කරනු ලැබූ මෝටර් වාහනය තුළ සුරක්ෂිතව තිබිය යුතු අතර, ධාවන බලපත්‍රයේ ඡායාපිටපතක් වාහනයේ ඉදිරිපස වාමුවාවේ පැහැදිළිව පෙනෙන අයුරින් ප්‍රදර්ශනය කළ යුතු ය.

බස් රථ මිලට ගැනීම සඳහා නිර්දේශ කිරීම.

47. හුදෙක් ම මඟී ප්‍රවාහන සේවාවේ උනන්තිය සලකා යෝග්‍ය අවස්ථාවන්හි දී පොදු රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව බස් රථ මිලදී ගැනීම සඳහා පහසුකම් සහ බදු සහන ලබාදීම සඳහා අධිකාරිය විසින් නිර්දේශ නිකුත් කළ හැකි ය.

## VII වන කොටස

## වරදවල් හා දඬුවම්

වැරදි හා දඬුවම්.

48. (1) අධිකාරිය විසින් හෝ වෙනත් කිනම් හෝ ආයතනයක් මඟින් නිකුත් කරන ලද මඟී ප්‍රවාහන සේවා බලපත්‍රයක අධිකාරිය යටතේ වයඹ පළාත තුළ මඟී ප්‍රවාහනයේ යෙදෙන බස් රථයක ගමන් කරන,

(අ) තමාගෙන් අයවිය යුතු ගාස්තු ගෙවීම පැහැර හරින හෝ,

(ආ) ස්වකීය ගමනාන්තයට පැමිණි විට බස්රථයෙන් බැසීම හිතාමතාම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින හෝ,

(ඇ) කිසියම් තැනැත්තෙකුට පීඩාකාරී හෝ අපහාස වන කිසියම් ආකාරයේ යම් අසභ්‍ය, අයෝග්‍ය හෝ ආවේගශීලී භාෂාවක් හෝ අභිනයක් හෝ හැසිරීමක් භාවිතා කරන හෝ සිදු කරන හෝ, යම් මගියෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලබන අතර, එම වරද සිදු කරන මගියාගෙන් අයවිය යුතු ගාස්තුව මෙන් දෙගුණයක් හා රුපියල් දහස (රු.1000.00) ක ස්ථානීය දඩයක් එම මගියා විසින් ගෙවිය යුතු ය.

(2) (අ) අධිකාරිය විසින් හෝ වෙනත් ආයතනයක් විසින් නිකුත් කරන ලද බල පත්‍රයක් යටතේ ධාවනය කරන බස් රථයක ගමන් අවසර පත්‍රයක් හෝ ප්‍රවේශ පත්‍රයක් නොමැතිව ගමන් කරන හෝ,

(ආ) ඒ ගමන් වාරය සඳහා තමාට නිකුත් කළ ප්‍රවේශ පත්‍රය ගමන මුළුල්ලේ ම අවසානය දක්වා තමා සතුව රඳවා නොගන්නා හෝ,

(ඇ) ඒ බස් රථයේ කොන්දොස්තරවරයා විසින් හෝ තත්කාලය සඳහා අධිකාරිය විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තෙකු විසින් ඉල්ලා සිටි විට, ඒ ප්‍රවේශ පත්‍රය පෙන්වීම හෝ භාරදීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන මගියෙකු, මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරන අතර, එම වරද සිදු කරනු ලබන මගියාගෙන් අයවිය යුතු ගාස්තුව මෙන් දෙගුණයක් හා රුපියල් දහස (රු.1000.00) ක ස්ථානීය දඩයක් අධිකාරිය විසින් බලය දෙනු ලබන අධිකාරියේ යම් නිලධරයකුට ගෙවිය යුතු ය.

(3) (අ) අධිකාරියේ අවසරය මත නිකුත් කරන ලද යම් ප්‍රවේශ පත්‍රයක් හෝ අවසර පත්‍රයක් වංචා සහගත ලෙස පාවිච්චි කරනු ලබන හෝ ඒ සඳහා වෙනත් තැනැත්තෙකුට ඉඩ දෙනු ලබන ඕනෑම තැනැත්තෙකු,

(ආ) එවැනි යම් ප්‍රවේශ පත්‍රයක් හෝ අවසර පත්‍රයක් වංචා සහගත ලෙස අනුකරණය කරන, ස්වභාවය වෙනස් කරන හෝ විකෘති කරන ඕනෑම තැනැත්තෙකු,

(ඇ) එවැනි යම් ප්‍රවේශ පත්‍රයක් හෝ අවසර පත්‍රයක් හෝ අවසරය නොමැතිව විකුණන, සපයන හෝ බෙදාහරින ඕනෑම තැනැත්තෙකු,

(ඈ) අවසරය නොමැතිව එවැනි ප්‍රවේශ පත්‍රයක් හෝ අවසර පත්‍රයක් ලෙස මුද්‍රණය කරන ලද හෝ කරනු ලැබූ පාවිච්චි කරන ලද යම් ප්‍රවේශ පත්‍රයක් මුද්‍රණය කරන ඕනෑම තැනැත්තෙකු,

(ඉ) බස් රථයේ ගමන් කරන මගියෙකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන කොන්දොස්තරවරයෙකු වන තැනැත්තෙකු,

(ඊ) බස්රථයේ වලංගු ටිකට් පතක් සහිතව ගමන් කරන මගියෙකුට පීඩාකාරී හෝ අපහාස වන කිසියම් ආකාරයේ යම් අසභ්‍ය, අයෝග්‍ය හෝ ආවේගශීලී භාෂාවක් හෝ අභිනයක් හෝ හැසිරීමක් භාවිතා කරන හෝ සිදු කරන එකී බස් රථයේ රියැදුරකු හෝ කොන්දොස්තරවරයකු වන තැනැත්තෙකු,

(උ) මගීන් ප්‍රවාහනය කරනු ලබන බස් රථයක වූ අභ්‍යන්තරික ශබ්ද ජනක යන්ත්‍ර හෝ උපකරණවල ශබ්ද මට්ටම අධිකාරිය විසින් නියම කරනු ලබන ශබ්ද මට්ටම ඉක්මවනු ලබන අවස්ථාවක, එම බස් රථයේ අවසර පත්‍රය දරන්නෙකු, රියැදුරකු හෝ කොන්දොස්තරවරයකු වන තැනැත්තෙකු,

(ඖ) රියැදුරෙකු හෝ කොන්දොස්තරවරයෙකු හෝ රිය සහායකයකු ලෙස නිසි පරිදි අධිකාරියේ ලියාපදිංචි නොවී හෝ එසේ ලියාපදිංචි වුවද, එහි ලියාපදිංචිය අවලංගුව පවතින අවස්ථාවක අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ මගී ප්‍රවාහනයේ යෙදෙන ඕනෑම තැනැත්තෙකු,

(ඵ) අධිකාරියට අයත් බස් නැවතුම්පලක පිහිටි හෝ වෙනත් ස්ථානයක පිහිටි ගොඩනැගිල්ලක හෝ මගී ආවරණයක හෝ අධිකාරියේ අවසරයකින් තොරව දැන්වීම් ප්‍රදර්ශනය කරන දැන්වීම් අලවන හෝ අකුරු, පාඨ, වචන ලිවීමෙන් හෝ රූප හෝ ඡායාරූප හෝ වෙනත් සලකුණු ඇඳීමෙන් දැන්වීම් ප්‍රදර්ශනය කරන හා ඕනෑම අයුරකින් හිතාමතාම අපවිත්‍ර කරනු ලබන තැනැත්තෙකු,

මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරන අතර, මහේස්ත්‍රාත්වරයෙකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දහසකට (රු. 1000.00) නොඅඩු සහ රුපියල් විසිපන්දහස (රු. 25,000.00) නොඉක්මවන දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(4) ඉහත (1) (2) (3) උප වගන්ති යටතේ සඳහන් අවස්ථාවල දී හැර මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලට එකඟව ක්‍රියා කිරීමට අපොහොසත් වන හෝ පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයෙකු විසින් එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක්දහස් පන්සියයකට (රු. 1500.00) නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට (රු. 25,000.00) නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

*වරදකරුවන් අත්අඩංගුවට ගැනීම.*

49. මෙම ප්‍රඥප්තියේ ඉහත (1)(2)(3)(4) යන උපවගන්ති යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරනු ලබන ඕනෑම තැනැත්තෙක් ඕනෑම පොලිස් නිලධරයකු විසින් නිත්‍යානුකූල ආකාරයට අත්අඩංගුවට ගනු ලැබිය හැකි අතර, එසේ අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තා වහාම නීතියට අනුව ක්‍රියා කිරීම සඳහා මහෙසත්‍රාත්වරයෙකු ඉදිරියට පැමිණවීමට ක්‍රියා කළ යුතු ය.

*සාවද්‍ය වාර්තා ඉදිරිපත් කිරීම.*

50. දැනුවත්ව ව්‍යාජ හෝ සාවද්‍ය විස්තර ඇතුළත් යම් වාර්තාවක් ලිඛිත තොරතුරක් හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් අධිකාරියට හෝ අධිකාරියේ බලයලත් තැනැත්තෙකුට ඉදිරිපත් කරන යම් තැනැත්තෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කළා වන අතර, ඒ පිළිබඳව මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහස (රු. 5,000.00) කට නොඅඩු සහ රුපියල් පනස්දහස (රු. 50,000.00) කට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකකටම හෝ යටත් කළ යුතු ය.

*ස්ථානීය ගාස්තු ගෙවීම් පැහැර හැරීමේ දී දඬුවම්.*

51. මේ ප්‍රඥප්තියේ යම් විධානයක් හෝ ඒ යටතේ පනවන ලද නිකුත් කරන ලද හෝ දෙන ලද යම් නියෝග යක්, නියමයක් හෝ විධානයක් මත පැනවූ ස්ථානීය දඩ ගෙවීම පැහැර හැරීමක් සිදුකරන, උල්ලංඝනය කරන හෝ ක්‍රියාත්මක නොකරන යම් තැනැත්තෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කළා වන අතර, ඒ පිළිබඳව මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහස් පන්සියයකට (රු. 1,500.00) නොඅඩු රුපියල් පන්දහසකට (රු. 5,000.00) නොවැඩි දඩයකට හෝ මාස තුනක නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් කළ යුතු ය.

52. මෙම ප්‍රඥප්තිය යටතේ වූ වැරදි සම්බන්ධයෙන් නඩු කටයුතු පැවරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින් ලියවිල්ලක් මගින් බලය දෙනු ලැබූ නිලධරයකු හෝ සේවකයකු අධිකාරියේ නිලධරයකු ලෙස සැලකිය යුතු ය. නඩු පැවරීම සඳහා බලය දීම.

53. බස් නැවතුම්පොළවලින් හෝ බස් රථ නැවතුම් ස්ථානවලින් අනවසරයෙන් මගීන් ගැනීම ඊට සහාය වීමට මගීන් එක්රැස් කිරීමේ අරමුණෙන් ශබ්දනගා කෑගැසීම එම ස්ථානවල අධිකාරියේ නිලධාරීන්ගේ රාජකාරි කටයුතුවලට බාධා හෝ අවහිර වන ලෙස කටයුතු කිරීම, දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි අවස්ථාවක පොලිස් නිලධාරීන්ට හෝ අධිකාරියේ නිළධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාළ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර, නඩු විභාගයකින් වැරදිකරු වුවහොත් රුපියල් දෙදහසකට (රු. 2000.00) නොඅඩු රුපියල් පනස් දහසකට (50,000.00) නොවැඩි දඩයකට හෝ අවුරුද්දක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකටම යටත් විය යුතු ය. බස්රථ නැවතුම්පොළවලින් හෝ නැවතුම් ස්ථානවලින් අනවසරයෙන් මගීන් ගැනීම.

54. අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව පාසල් ළමුන් ප්‍රවාහනය කිරීම නොකළ යුතු අතර, එසේ කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි. ඉහත වරද සිදුකරන තැනැත්තාගෙන් එම වරද සඳහා රුපියල් පන්දහක (රු. 5000.00) ස්ථානීය දඩයක් අධිකාරියේ බලයලත් නිලධාරියෙකු අය කළ එම දඩ මුදල ගෙවීම පැහැර හැරි අවස්ථාවක පොලිස් නිලධාරීන්ට හෝ අධිකාරියේ නිලධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාළ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර, නඩු විභාගයකින් වැරදිකරු වුවහොත් රුපියල් දෙදහසකට (රු. 2000.00) නොවැඩි රුපියල් පනස්දහස (රු. 50,000.00) නොඉක්මවන දඩයකට හෝ අවුරුද්දක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකට ම යටත් විය යුතු ය. අවසර පත්‍ර නොමැතිව පාසල් ළමුන් ප්‍රවාහනය.

55. අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් අවසරපත්‍රයක් නොමැතිව කර්මාන්ත ශාලා සඳහා සේවක සේවිකාවන් ප්‍රවාහනය කිරීම නොකළ යුතු අතර, එසේ කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි. එම වරද සිදු කරනු ලබන තැනැත්තාගෙන් අදාළ වර්ෂය සඳහා අයකරනු ලබන බලපත්‍ර ගාස්තුව මෙන් දෙගුණයක් හා රුපියල් පන්දහසක (රු. 5000.00) ක ස්ථානීය දඩයක් අධිකාරිය විසින් බලය දෙනු ලබන අධිකාරියේ යම් නිලධරයකුට ගෙවිය යුතු ය. එවැනි ගෙවීමක් පැහැර හැරි අවස්ථාවක පොලිස් නිලධාරීන්ට හෝ අධිකාරියේ නිලධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාළ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර, නඩු විභාගයකින් වැරදිකරු වුවහොත් රුපියල් දෙදහස (රු. 2000.00) කට නොඅඩු සහ රුපියල් පනස් දහසකට (රු. 50,000.00) කට නොවැඩි දඩයකට හෝ අවුරුද්දක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකට ම යටත් විය යුතු ය. බලපත්‍ර නොමැතිව වෙනත් පොදු මගී ප්‍රවාහන සේවා සැපයීම.

56. අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරිය වෙත පවරා ඇති බලතල කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේ දී හෝ අධිකාරිය විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් එසේ බලය පවරන ලද කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේ දී ඊට නීති විරෝධී ලෙසින් බාධා පමුණුවන, මැදිහත් වන, එරෙහි වන හෝ බලපෑම් කරන තදනන්තර ප්‍රතිරෝධය පාන නැතහොත් එසේ කිරීමට උත්සාහ දරන ඕනෑම තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයෙන් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහස (රු. 2000.00) කට නොඅඩු සහ රුපියල් පනස් දහස (රු. 50000.00) නොඉක්මවන දඩයකට හෝ අවුරුද්දක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දෙකට ම යටත් විය යුතු ය. අධිකාරියට බාධා කිරීම, බලපෑම් කිරීම.

## VIII වන කොටස

### ඉවත් කිරීම සහ අන්තර් කාලීන විධිවිධාන

ඉවත් කරන ලද ප්‍රඥප්ති යටතේ රෙගුලාසි (නියෝග)

57. අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියේ 5 (1) වන උපවගන්තිය යටතේ අධිකාරියේ අධ්‍යක්ෂවරුන් පත් කරන තුරු වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 04 දරන වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබ මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පූර්වාසන්නයෙන් වූ දිනය දක්වා 1995 අංක 04 වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ධූර දරන ලද සියලුම තැනැත්තන් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පූර්වාසන්නයෙන් වූ දිනය දක්වා 1995 අංක 04 වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අධ්‍යක්ෂවරුන් ලෙස සැලකිය යුතු වන්නේ ය.

අධිකාරියේ සේවා නියුක්තයන්

58. ප්‍රඥප්තියේ ක්‍රියාත්මක දිනයට පෙරාතුව වූ දිනයේ දී 1995 අංක 04 දරන වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ සේවයේ නියුක්ත සියලු නිළධාරීන් හා වෙනත් සේවා නියුක්තයන් ඔවුන් එකී මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ වූ සේවා නියුක්තියට සම්බන්ධ නියමයන් හා කොන්දේසිවලට යටත්ව අධිකාරියේ සේවාවේ සේවා නියුක්තයන් ලෙස සලකනු ලැබිය යුතු ය. එම සේවා නියුක්තයන්ගේ සේවය ඔවුන්ගේ සේවා නියුක්තිය පිළිබඳව නිත්‍යානුකූල හේතු මත හැර වෙනත් ආකාරයකට අවසන් කරනු නොලැබිය යුතු ය.

ගිවිසුම් අයිතිවාසිකම් බැදීම්, වගකීම් සහ පවරා ඇති සහ පවතින නඩු සඳහා වූ ප්‍රතිපාදන

59. (1) ප්‍රඥප්තියේ ක්‍රියාත්මක දිනයට පෙරාතුවම දිනයේ දී 1995 අංක 04 දරන වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත එකී අධිකාරිය සතු සියලුම අරමුදල් ද ඇතුළුව එකී අධිකාරියේ සියලු නිශ්චල සහ චංචල දේපළ අධිකාරිය වෙත සතු කළ යුතු අතර, එකී සියලු දේපළ අධිකාරියේ දේපළක් විය යුතු ය.

(2) ප්‍රඥප්තියේ ක්‍රියාත්මක දිනයට පෙරාතුව වූ දිනයේ දී බලාත්මක ව පවතින 1995 අංක 04 දරන වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් එළඹ ඇති සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්ත භාරකාර අරමුදල, පාරිතෝෂික සම්බන්ධන සියලු බැදීම් සහ වගකීම් ඇතුළු සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් අධිකාරියේ කොන්ත්‍රාත් ගිවිසුම් ලෙස සැලකිය ලැබිය යුතු ය.

(3) ප්‍රඥප්තියේ ක්‍රියාත්මක දිනයට පෙරාතුව වූ දිනයේ දී යම් අධිකරණයක හෝ විනිශ්චය සභාවක 1995 අංක 04 දරන වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් හෝ එම අධිකාරියට විරුද්ධව පවරා ඇති හෝ ඉදිරිපත කරන ලද නඩුවක්, ඉල්ලීමක් හෝ අභියාචනාවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒවා පවත්වා ගෙන යාම හෝ අවසන් කරනු ලැබීම කළ හැකි ය.

(4) නියමිත දිනට පෙරාතුම වූ දිනයේ දී 1995 අංක 04 දරන වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් හෝ ඊට එරෙහිව පවරා ඇති හෝ ඉදිරිපත් කර ඇති යම් නඩුවකදී, ඉල්ලීමක දී හෝ අභියාචනයක දී අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරියක් විසින් වාර්තාගත කොට ඇති හෝ ප්‍රදානය කරන ලද තීන්දු ප්‍රකාශයක් හෝ ප්‍රදානයක් අවස්ථාවෝචිත පරිදි අදිකාරියට වාසියට හෝ එයට එරෙහිව වාර්තාගත කොට ඇති හෝ ප්‍රදානය කරන ලද තීන්දු ප්‍රකාශකයක් බවට හෝ ප්‍රදානයක් බවට හෝ සලකනු ලැබිය යුතු අතර, සිවිල් නඩු විධිවිධාන සංග්‍රහයේ විධිවිධාන වලට හෝ තීන්දු ප්‍රකාශයක් හෝ ප්‍රදානයක් ක්‍රියාවේ යෙදවීමට අදාළ වෙනත් යම් ප්‍රඥප්තියකට යටත් අධිකාරිය විසින් හෝ එයට එරෙහිව ක්‍රියාවේ යෙදිය හැකි ය.

(5) 1995 අංක 04 දරන වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද්දා වූ ද, නැතහොත් එකී ප්‍රඥප්තිය යටතේ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලෙස සලකනු ලැබුවා වූද, මෙම ප්‍රඥප්තිය බලාත්මක වන දිනට පූර්වාසන්නයේ වලංගුව ඇත්තාවූද, මගී ප්‍රවාහන සේවා බලපත්‍රයක් හෝ වෙන යම් ලියකියවිල්ලක් මෙම ප්‍රඥප්තිය යටතේ කලින් නිකුත් කර අවලංගු කරනු නොලැබුවහොත් එහි සඳහන් වලංගු කාලය තුළ මෙම ප්‍රඥප්තිය නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

60. මෙම ප්‍රඥප්තිය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## IX වැනි කොටස

### අර්ථ නිරූපණය

61. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අර්ථ නිරූපණයක් අවශ්‍ය වන්නේ නම් මිස,

- ''පළාත'' යන්නෙන් වයඹ පළාත අදහස් වන්නේ ය.
- ''සභාව'' යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව අදහස් වන්නේ ය.
- ''ආණ්ඩුකාරවරයා'' යන්නෙන් වයඹ පළාත් සභාවේ ආණ්ඩුකාර ධූරය දරන තැනැත්තා අදහස් වේ.
- ''අමාත්‍ය මණ්ඩලය'' යන්නෙන් වයඹ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය අදහස් වන්නේ ය.
- ''අමාත්‍යවරයා'' යන්නෙන් වයඹ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ ප්‍රවාහන සේවා විෂයභාර අමාත්‍යවරයා අදහස් වන්නේ ය.
- ''ජ්‍යෙෂ්ඨ නිලධාරියකු'' යන්නෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහකාර ලේකම් ධූරයට නොඅඩු ධූරයක නිලධාරියකු හෝ ඒ හා සමාන්තර සේවාවල ඒ හා සමාන නිලයක් දරන අයෙකු අදහස් වන්නේ ය.
- ''නිලධාරියා'' යන්නෙන් වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් ඇතුළුව අධිකාරියේ සේවය කරන සියලු සේවකයින් අදහස් වන්නේ ය.
- ''බලපත්‍රය'' යන්නෙන් ''මගී ප්‍රවාහන සේවා බලපත්‍රය'', ''විශේෂ සේවා අවසර පත්‍රය'', ''මාර්ග බලපත්‍රය'' හා ''නිත්‍ය ප්‍රවාහන සේවා බලපත්‍රය'', ''පාසල් සේවා බලපත්‍රය'', ''කර්මාන්ත ශාලා ප්‍රවාහන සේවා බලපත්‍රය'' යන නම්වලින් කුමන හෝ නමකින් මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ ගාස්තුවක්, ත්‍යාගයක්, ප්‍රතිලාභයක් හෝ වෙන් වෙන් ගාස්තු මත මෝටර් වාහනයක් මගින් මගී ප්‍රවාහනයේ හෝ භාණ්ඩ ප්‍රවාහනයේ යොදා ගැනීම සඳහා බලය දෙමින් නිකුත් කරන ලද බලපත්‍රයක් අදහස් වන්නේ ය.

- ''බස්නැවතුම්පොළ'' යන්නෙන් වයඹ පළාත් තුළ පිහිටි බස් මඟී පර්යන්ත යනුවෙන් අදහස් විය යුතු අතර, *ගැසට්* කරන ලද වයඹ පළාත් තුළ පිහිටි බස්රථ ගාල් අධිකාරිය සතු වයඹ පළාත තුළ පිහිටි බස් නැවතුම්පොළවල් හා මහ මග දෙපස බස් නවත්වන ස්ථානද ඇතුළත් විය යුත්තේ ය.

- *''ගැසට් පත්‍රය''* යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතානත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* අදහස් වන්නේ ය.

- ''පළාත් පාලන ආයතන'' යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන්නේ ය.

- ''බස් රථය'' යන්නෙන් බස් රථයක් වශයෙන් ලියාපදිංචි කරන මෝටර් කෝච් රථයක් අදහස් වන අතර ඊට ද්විත්ව කාර්ය වාහනයක් ද ඇතුළත් වන සේ සලකනු ලැබිය යුතු වන්නේ ය.

- ''මගියා'' යනු කුළී රථයක හෝ බස් රථයක, පාසල් සේවා බස් රථයක හෝ වෑන් රථයක, කර්මාන්තශාලා බස් රථයක ගාස්තුවක් ගෙවා ගමන් කරන තැනැත්තෙකු අදහස් වන්නේ ය.

- ''ගාස්තුව'' යන්නෙන් බස් රථයක මගියකු වශයෙන් ගෙන යනු ලැබීමට යම් තැනැත්තෙකුට හිමිකම් ලබා දෙන ඒ තැනැත්තා විසින් කරනු ලබන ගෙවීම් අදහස් වන්නේ ය.

- ''මෝටර් වාහනය'' යන්නෙන් මෝටර් රථ ප්‍රවාහන පනතේ අර්ථ නිරූපණය කර ඇති මෝටර් වාහනයක් අදහස් වන්නේ ය.

- ''මගී ප්‍රවාහන සේවාව'' යන්නෙන් මහා මාර්ග ඔස්සේ ගාස්තුවක් අය කරමින් මගීන්, පාසල් සිසුන්, කාර්යාල සේවකයින්, කර්මාන්තශාලා සේවකයින්, මගීන් ප්‍රවාහනය කරනු ලබන සෑම වාහනයක් ම අදහස් වන්නේ ය.

- ''විධිමත් බඳවා ගැනීමේ පටිපාටිය'' යන්නෙන් වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන බඳවා ගැනීමේ පටිපාටිය අදහස් වන්නේ ය.

- ''රියදුරු'' යන්නෙන් මෙම ප්‍රඥප්තියේ සඳහන් ඕනෑම වාහනයක් පැදවීම සඳහා ඊට අදාළ වලංගු රියදුරු බලපත්‍රය සහිතව රිය පදවන්නෙකු අදහස් වන්නේ ය.

- ''කොන්දොස්තර'' යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් වන සෑම වාහනයකම මගීන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කරන පහසුකම් හා ආරක්ෂාව සහ මගී සුභසාධනය සලසන, අධිකාරිය මගින් නිකුත් කළ අනන්‍යතා බලපත්‍රයක් හිමි තැනැත්තෙකු අදහස් වන්නේ ය.

- ''රිය සහායක'' යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ ඕනෑම වාහනයක රියදුරුගේ සහායට සිටින අධිකාරිය මගින් යථා පරිදි පුහුණු කිරීමෙන් පසු බලපත්‍රයක් නිකුත් කළ තැනැත්තෙකු අදහස් වන්නේ ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.